සභාපති,

සාක්ෂිකරුවන් හා වින්දිතයන් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය

අංක 428/11 ඒ,

ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,

බත්තරමුල්ල.

සභාපතිතුමනි,

**බන්ධනාගාර රැඳවියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම**

හිටපු බන්ධනාගාර ප්‍රතිසංස්කරණ සහ සිරකරුවන් පුනරුත්ථාපනය කිරීමේ රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්තේ මහතා බන්ධනාගාර තුළට ඇතුළු වී, රැඳවියන්ගේ ආරක්ෂාවට තර්ජනයක් වන ආකාරයට හැසිරීමේ සිදුවීම් දෙකක් පසුගිය සතියක පමණ කාලය තුළ වාර්තා විය. සැප්තැම්බර් මස 6 වැනිදා රාත්‍රියේ ඔහු වැලිකඩ බන්ධනාගාරයට තවත් පිරිසක් සමග ඇතුළු වී, බන්ධාගාර නිලධාරීන්ට තර්ජනය කරමින් හා රැඳවියන්ට තර්ජනය කරමින් බීමතින් හැසිරුණු බව වාර්තා විය. ඉන් අනතුරුව සැප්තැම්බර් මස 12 වැනිදා පස්වරුවේ අනුරාධපුර බන්ධනාගාරයට ගොස් එහි රක්ෂිත බන්ධනාගාරගතව සිටි රැඳවියන් 8 දෙනෙකු සිර මැදිරි වලින් එළියට ගෙන දණගස්වා හිංසා කළ සිදුවීමක්ද වාර්තා විය. දේශපාලන සිරකරුවන් ලෙස අනුරාධපුර රක්ෂිත බන්ධනාගාරයේ රඳවා සිටින දර්ශන් හා සුලක්ෂන් නම් රැඳවියන් දෙදෙනා දණගස්වා. ඔවුන්ගේ හිසට ගිනි අවි තබා මරණීය තර්ජන එල්ල කර තිබේ. මෙය පැති කිහිපයකින්ම ඉතා බරපතල සිදුවීමක් වේ.

එකක් වන්නේ මේ රැඳවියන් යම් වරදක් සම්බන්ධයෙන් අධිකරණයේ වැරදිකරුවන් වූ අය නොව රක්ෂිත බන්ධනාගාරගතව සිටින චූදිතයන් පමණක් වීමයි. එමෙන්ම ඔවුන් ජාතික වශයෙන් වැදගත් සිදුවීම් වල සාක්ෂිකරුවෝ වෙති. ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධ වගකීම බන්ධනාගාර දෙපාර්තමේන්තුව ඇතුළු රාජ්‍ය ආයතන භාරගත යුතුය. නමුත් එම වගකීම භාර ගන්නා බවක් නොපෙනේ. මෙම සිදුවීමට අදාලව බන්ධනාගාර

කොමසාරිස්වරයා එවැනි සිදුවීමක් වාර්තා වී නොමැති බවට කළ වගකීම් විරහිත ප්‍රකාශය අතිශය බරපතල වේ. එවැනි සිදුවීමක් ඇතිවූ බව පසුව අදාළ රාජ්‍ය ඇමතිවරයා පවා පිළිගෙන තිබිණි. මෙතරම් බරපතල සිදුවීමක් සිදුවී පැය 24ක් යන තුරුත් බන්ධනාගාර කොමසාරිස්වරයා එය නොදන්නේනම් එය බරපතල වන අතර, එවැන්නක් දැනගෙනම ඊට එරෙහිව නීතිමය පියවර නොගෙන ප්‍රචණ්ඩකාරීව හැසිරුණු අය වසන් කිරීමට ඔහු උත්සාහ කළේනම් එය වඩාත් බරපතලය. මීට පෙර බන්ධනාගාර තුළදී රැඳවියන් මරා දැමුණු අවස්ථා පවා වාර්තා වූ බැවින් මේ සිදුවීමත් සමග රැඳවියන්ගේ ආරක්ෂාව බරපතල අවදානමකට ලක්ව තිබේ. අනෙක රැඳවියන්ට මරණීය තර්ජන එල්ල කිරීම සඳහා මෙකී පුද්ගලයන් ආයුධ සන්නද්ධව බන්ධනාගාරයක් තුළට ඇතුළු වූයේ කෙසේද යන්නයි. මේ වනවිට නිරෝධායන රෙගුලාසි පනවා නීතීඥයන්ට පවා සිය සේවාදායකයන් හමුවීමට බන්ධනාගාර තුළට ඇතුළු වීමේ අයිතිය අත්හිටුවා තිබේ. රාජ්‍ය ඇමතිවරයා සිය ඇමති ධුර අතරින් එකකින් ඉල්ලා අස්වී ඇතත් ඔහුට එරෙහිව නීතිය ක්‍රියාවේ යෙදවී නැත. එමෙන්ම මෙම සිදුවීමට සම්බන්ධ අනෙකුත් පුද්ගලයන් සම්බන්ධ විමර්ශනයක් සිදුවී නැති අතර ඔවුන් අත්අඩංගුවට ගැනීමක්ද සිදුව නැත.

උක්ත සිදුවීමට සම්බන්ධ රාජ්‍ය ඇමතිවරයා වන ලොහාන් රත්වත්තේ මීට පෙරද මිනීමැරුම් චෝදනා ඇතුළු අපරාධ වලට චෝදනා ලැබුවෙකු නිසා බන්ධනාගාර රැඳවියන්ගේ ආරක්ෂාව පිලිබඳ ඉතා බරපතල අවදානමක් අපි නිරීක්ෂණය කරමු. 1997 වකවානුවේ සමාජ ශාලාවක ඇතිවූ ගැටුමකදී හැව්ලොක් රග්බි ක්‍රීඩා සමාජය වෙනුවෙන් ක්‍රීඩා කළ පැපුවා නිව්ගිනි ජාතිකයෙකු වූ ජොයෙල් ප්‍රේරා වෙඩි තබා මරා දැමීම ගැන ඔහුට චෝදනා එල්ල විය. පසුව 2001 දෙසැම්බර් 5 වැනිදා මහ මැතිවරණ දිනයේදී මහනුවර, කටුගස්තොට, උඩතලවින්න ප්‍රදේශයේදී අවුරුදු 20-30 අතර මුස්ලිම් තරුණයන් දස දෙනෙකු ඝාතනය කිරීමේ චෝදනාව ඔහුට එල්ල විය. අපරාධය පිලිබඳ සාක්ෂි අපැහැදිලි වීමේ හේතුව මත ඔහු නිදහස් වුවත් සාක්ෂිකරුවන්ට තර්ජන හා බලපෑම් කිරීම සම්බන්ධයෙන් ඔහුට එරෙහි චෝදනාවක් ඒ දිනවල මාධ්‍ය වල ප්‍රකාශයට පත්විය. ඊට අමතරව ලොහාන් රත්වත්තේ ජාතිවාදී ගැටුම් ඇති කිරීමේ උවමනාවෙන් ප්‍රචණ්ඩ ක්‍රියා සහ ප්‍රකෝපකාරී ක්‍රියා කළ බවට ඔහුට චෝදනා ගණනාවක් එල්ල වී තිබේ. 2018 දෙසැම්බර් 28 වැනිදා කෑගල්ල දිස්ත්‍රික්කයේ රන්දිවෙල, හිඟුල සහ මහන්තේගම ප්‍රදේශ වල බුද්ධ ප්‍රතිමා මිටි වලින් පහරදී කඩා දමා ජාතිවාදී ප්‍රකෝපකාරීත්වයක් ඇති කිරීමට උත්සාහ කළ තරුණයන් හය දෙනෙකු මාවනැල්ල පොලීසිය විසින් අත්අඩංගුවට ගත් අතර තමන්ට මුදල් දී එම ක්‍රියාව සඳහා මෙහෙයවූයේ ලොහාන් රත්වත්තේ සහ දිලුම් අමුණුගම යන දේශපාලඥයන් බවට ඔවුන් පොලීසියට පාපොච්චාරණය කර තිබිණි. එල්.ටී.ටී.ඊ. සංවිධානයට සම්බන්ධ වීමේ චෝදනාව යටතේ අනුරාධපුර බන්ධනාගාරයේ රඳවා සිටින රැඳවියන්ගේ ආරක්ෂාව ඉතා බරපතල තර්ජනයකට ලක්ව ඇති බව අපි විශ්වාස කරන්නේ මෙකී පසුබිම යටතේය.

එනිසා 2015 අංක 04 දරණ අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහය දීමේ හා ආරක්ෂා කිරීමේ පනතේ 11 වන වගන්තියෙන් ඔබ අධිකාරියට පැවරී ඇති බලතල ප්‍රකාරව බන්ධනාගාර රැඳවියන්ගේ ආරක්ෂාව, අයිතිවාසිකම් හා නීතිමය හිමිකම් තහවුරු කිරීමට පියවර ගන්නා ලෙසද, උක්ත සිදුවීමට අදාළ විමර්ශනයක් සිදුකර, අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා ලෙස පොලීසිය ඇතුළු අදාළ රාජ්‍ය ආයතන වලට නිර්දේශ ඉදිරිපත් කරන ලෙසද ඉල්ලා සිටිමු. මේ සම්බන්ධයෙන් කඩිනම් හා විශ්වසනීය ක්‍රියාමාර්ග ගැනීමට සාක්ෂිකරුවන් හා වින්දිතයන් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය ලෙස ඔබ ඉදිරිපත් වනු ඇතැයි අපේක්ෂා කරමු.

ස්තුතියි.

මෙයට,



පුබුදු ජයගොඩ

පෙරටුගාමී සමාජවාදී පක්ෂය

2021 සැප්තැම්බර් 16


**22/1 මෙල්ඩර් පෙදෙස, නුගේගොඩ**

**No.22/1, Melder Place, Nugegoda**

**Tel- 0094 112824198 Fax-071 880 3259 Email-media.flsp@gmail.com Web- frontlinesp.lk**